**ශීර්ෂය 181- එලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබද විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

1 - කොටස

**එලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 328 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.652,300,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.567,393,914 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් පිළිවෙලින් රු.27,548,512 ක් හා රු.57,357,574 ක්වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 8 ක් හා සියයට 20 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වැය ශීර්ෂය** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ප්‍රතිශතයක් ලෙස** |
| | රු. | රු. | රු. | |
| 181 | 365,100,000 | 337,551,488 | 27,548,512 | 08 |
| 328 | 287,200,000 | 229,842,426 | 57,357,574 | 20 |
| එකතුව | 652,300,000 | 567,393,914 | 84,906,086 | 13 |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18101 | 7,500,000 | 5,758,444 | 1,300,000 | 3,562,453 | 17,500,000 | 15,153,881 |
| 32801 | 20,000,000 | 19,300,290 | 8,000,000 | 8,495,407 | 73,000,000 | 43,531,688 |

**2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

**2.3.1 අග්‍රිම ගිණුම**

මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.6,518,790 ක් වී තිබුණි.

**2.3.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.3,301,281ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| එලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 6000-0000-00-0015-0181 | 3,252,137 |
| මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 6000-00-0000-00-0011-15185 | 49,144 |
| **එකතුව** | | **3,301,281** |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 181. - එලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

එලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන සාක්ෂි නොවීම

-------------------------

විසර්ජන ගිණුමේ 181-1-2-1202 හා 1401 වැය විෂයයන් යටතේ කුලියට ගත් මෝටර් රථයක් වෙනුවෙන් වැය කළ කුලී හා ඉන්ධන වියදම වූ රු.429,808 ක් රාජකාරි කටයුතු වෙනුවෙන් සිදුකළ වියදම් බව සනාථ කිරීම සඳහා පිළිගත හැකි ලේඛන අමාත්‍යාංශය සතුව නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 04ක් සඳහා සළසා තිබුණු රු.2,500,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 98 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයයන් 08 ක් සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය අනුගමනය කර ලබාගත් එකතුව රු.2,435,865ක අතිරේක ප්‍රතිපාදන වර්ෂ අවසානය වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

**-------------**

නිසි ලෙස සැලසුම් කිරීමකින් තොරව අවස්ථා 33කදී ලබාගත් රු.297,689ක අත්තිකාරම් සියයට 15 සිට සියයට 100 දක්වා වැය කිරීමකින් තොරව ආපසු පියවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

**1.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------------

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 ජුනි 02 සහ 2014 නොවැම්බර් 14 යන දිනයන්හි භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.42,805,770 ක් වූ අතර, එම ශේෂ වර්ෂයකට වඩා අඩු විය.

**1.5 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 715(2) | - | භාණ්ඩ භාරගැනීම, භාරයේ තබා ගැනීම හා නිකුත් කිරීම යන ප්‍රධාන රාජකාරී ගබඩාව භාර නිලධාරියාගෙන් නිසි පරිදි ඉටු කරවා ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751(1) | 5,516,639 | 2012/2013 වර්ෂ ඇතුළත අවස්ථා 52 කදී ලබාගත් භාණ්ඩ තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම මෙම භාණ්ඩ මිලදී ගෙන ගබඩාව වෙත ලබා ගත් බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | 12,158,148 | 2012 වර්ෂයේ හා 2013 ජනවාරි 01 දින සිට විගණන දිනය වන 2013 ඔක්තෝබර් 17 දින දක්වා ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීම් කිසිවක් තොග ලේඛන පොතෙහි සටහන් නොකිරීම නිසා පරීක්ෂා කළ දිනයේදී පැවති භෞතික තොග ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. |
| (iii) මුදල් රෙගුලාසි 1647 (ආ) | | මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වාහන සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

## 1.6 කාර්යසාධනය

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් අවස්ථාවේදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

ජාතික එලදායිතා ලේකම් කාර්යාලය සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙන් සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තු 03 සඳහා නිම කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 1,121ක් සැලැසුම් කර තිබූ අතර ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 52.125 ක් විය. ඉන් ක්‍රියාකාරකම් 623ක් හෙවත් සියයට 55 ක් ඉටුකර ගැනීමට ජාතික එලදායිතා ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. තවද ක්‍රියාකාරකම් 03ක් ඉටුකර නොතිබුණි. තෙවන කාර්තුව අවසාන වන විට ඉලක්ක ගත වියදම රු.මිලියන 2ක්වූ (සියයට 100 ක්වූ) එක් ක්‍රියාකාරකමකින් ඉටුකරගෙන තිබුණේ සියයට 15 ක භෞතික ඉලක්ක පමණි.

## 1.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) පරිගණක සහ පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා අදාල ආයතනය සමග රු.2,357,194 ක ( එකතු කළ අගය මත බදු සහිත) මිලකට අමාත්‍යාංශය විසින් ගිවිසුම්වලට එළඹ තිබුණි. සැපයුම්කරු විසින් එම භාණ්ඩවලින් ඇතැම් භාණ්ඩ උපරිම වශයෙන් සති 7ක කාලපරිච්ඡේදයක් ප්‍රමාදවී සපයා තිබුණි. මේ හේතුවෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම ප්‍රමාද කාලයට අදාලව රු.90,318 ක ප්‍රමාද ගාස්තු අය කිරීමට නියෝග කර තිබුණි. සැපයුම්කරුට ගෙවීම් කිරීමේදී එම ප්‍රමාද ගාස්තුවලින් රු.50,285 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව රු.40,033 ක් අඩුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරිමට හේතු වූ කරුණු හෝ ඊට අදාල අනුමැතීන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මෝටර් රථයක් මසකට රු.40,000 බැගින් කුලියට ගැනීමට තීරණය කර තිබූ අතර, වර්ෂය තුළ රු.400,000ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි. මෙම මෝටර් රථයේ නඩත්තුව, අමතර ධාවනයන් සඳහා ගෙවිය යුතු මුදල, ඉන්ධන භාවිතය වැනි කිසිදු කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය අයිතිකරු සමඟ ගිවිසුමකට එලඹ නොතිබුණි.

## 1.8 අවිධිමත් ගනුදෙනු

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 සැප්තැම්බර් 30 දින රැස් වූ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව අනුව රු.2,537,194 ක පරිගණක සහ පරිගණක උපාංග මිලදී ගැනීම හදිසි අවස්ථාවක් ලෙස සළකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 මාර්ගෝපදේශය පරිදි ඍජු කොන්ත්‍රාත් ක්‍රමය මත ලංසු කැඳවීමකින් තොරව රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලට ගත යුතු බව තීරණය කර තිබුණි. ඇනවුමේ සඳහන් ඇතැම් භාණ්ඩ අමාත්‍යාංශය වෙත සති 07 ක ප්‍රමාදයකින් පසුව ලැබී තිබුණු බැවින් හදිසි අවශ්‍යතාවය මත තරගකාරීවයෙන් බැහැරවී සිදු කළ ප්‍රසම්පාදන තීරණය මතභේදාත්මක විය.

(ii) ඉහත (i) පරිදි අමාත්‍යාංශය මගින් උක්ත භාණ්ඩ මිලදී ගැනීම සඳහා නොගැලපෙන ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරාගෙන තිබුණි. මේ නිසා තරගකාරී ලංසු ක්‍රමයක් මගින් ගුණාත්මක භාණ්ඩ තරගකාරී මිලට ලබා ගැනීම සඳහා තිබූ ඉඩ ප්‍රස්ථාව ගිලිහී ගොස් තිබුණු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශයේ දක්වා ඇති ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශය ක්‍රියා කර නොතිබුණි.

(iii) යෝජිත භාණ්ඩ අයිතමය පමණක් සඳහන් කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 මාර්ගෝපදේශවලට පටහැනිව එම භාණ්ඩවල පිරිවිතරයන් සඳහන් නොකර ආයතන හතරකින් ලංසු කැඳවා රු.1,959,079 හා රු.965,130 කට වර්ෂය තුළදී ගෘහ භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(iv) ඉහත ලී බඩු සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.3 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණ ඇගැයීම් කමිටුවේ එම විෂය පිළිබඳ විශේෂඥ දැණුම ඇති නිලධාරියෙකු සිටිය යුතු වුවත්, එවැනි නිලධාරියෙකු එම කමිටුවට පත්කර නොතිබුණි.

(v) උක්ත මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.4.2(අ), (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව මිල කැඳවීම් සඳහා වූ ඉල්ලීමෙහි භාණ්ඩ වල වගකීම් කාලය සහ කොන්දේසි පිළිබඳව ද සඳහන් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී පමණක් මෙම

කරුණු සලකා බැලීමෙන් නිවැරදි  ලංසුකරු තෝරා ගැනීමට බාධාවක් වී තිබුණි.

**1.9** **පාඩු හා හානි**

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වර්ෂය තුළ වාහන තුනකට සිදුවූ සම්පූර්ණ අලාභය රු.423,560ක් වූ අතර, රක්ෂණ වන්දි ලෙස රු.356,217 ක් පමණක් ලැබී තිබුණි. මේ අනුව රු.67,243ක රජයට සිදුවූ අලාභය වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට විගණන දිනය  වූ  2014 ජුනි 06 දින  වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයට අයත් මෝටර් රථයක් අනතුරට පත් වීමෙන් රු.7,686,367ක අලාභ හානියක් සිදුවී ඇති අතර අනතුර සිදු වී  මාස 09 ක් ගතවී තිබුණද රක්ෂණ වන්දි ලබා ගැනීමට හෝ වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**1.10** **කළමනාකරණ දුර්වලතා**

----------------------------

ගබඩාවෙන් ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා අභ්‍යන්තර පාලන  ක්‍රමයක් හඳුන්වා දී තිබුණද දින 15ක ලිපිද්‍රව්‍ය ඉල්ලුම් පත්‍රවල නිකුත් කිරීම් නියැදියක් පරීක්ෂා කිරීමේදී සෑම ඉල්ලුම් පතකම අනුමත කරන මාණ්ඩලික නිලධාරියා, ගබඩා භාරකරු හා භාණ්ඩ භාරගත් අය අත්සන් කර නොතිබුණි.

**1.11** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 11 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 05 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 799 | 614 | 184 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 20 | 04 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 01 | 03 |
| | | ------ | ------ | ------- |

| | | | |
|---|---|---|---|
| **එකතුව** | 844 | 647 | 197 |
| | === | ==== | ==== |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 197ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 328 - මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

## 2.1 විගණන විෂය පථය

මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| පරිගණක, පරිගණක උපාංග හා දෘඩුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| නිවාඩු ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුව සතුව නොතිබීම නිසා එකතුව රු.171,014,619ක මුදලකට අදාලවූ ගනුදෙනු සම්බන්ධයෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ඇ) අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 19 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 99 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 32801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.460,322ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුව නිලධාරින් 340 දෙනෙකුට ලබා දී තිබුණු දේපල ණය, මෝටර් වාහන ණය, ආපදා ණය, උත්සව අත්තිකාරම් හා වෙනත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂවල එකතුව රු.43,056,162ක් විය. ණය සම්බන්ධයෙන් CC 10 ණය ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු බැවින් එක් එක් මාසයේදී අයකළ ණය පොලී ප්‍රමාණයන්ගේ නිරවද්‍යතාවය හා නිලධාරින්ට ණය ලබාදීමේදී අවකරන සීමාව සියයට 40 ඉක්මවන්නේද යන්න පහසුවෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2.4 වත්කම් කළමනාකරණය

**----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති

බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) පුස්තකාලය සතුවූ පිරිවැය රු.1,019,472 ක්වූ පොත් 2,088ක් පමණක් ඇතුළත් වූ පරිග්‍රහණ ලේඛනය, 2009 ඔක්තෝබර් 14 දිනට පසුව යාවත්කාලීන කර නොතිබුණි. මෙම පුස්තකාලය සඳහා 2013 දෙසැම්බර් 31 දින මිලදී ගන්නා ලද රු.98,763ක් වටිනා පොත් 241ක්ද සමඟ සියලු පොත් නිෂ්කාර්යව කාමරයක ගොඩගසා තිබුණි.

(ii) අක්‍රිය තත්ත්වයේ වූ ලැප්ටොප් පරිගණක, මොනිටර්, සීපීයූ, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් ඇතුලු වර්ග 05 කට අයත් අයිතම 21 ක ස්ථාවර වත්කම් වර්ෂ 04 ක පමණ කාලයක සිට ආයතනයේ රඳවා තබා ගෙන තිබුණු අතර 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එම ස්ථාවර වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

--------------------------

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.220,069ක් වූ අතර, වැය විෂයයන් දෙකක රු.28,059ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම්

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| **(i)** XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | 17,359 | දෙපාර්තමේන්තුවේ සේවය කර 2012 අගෝස්තු 28 දින මියගිය නිලධාරිණියකගෙන් අයවීමට තිබූ ගංවතුර අත්තිකාරම් ණය ශේෂය ඇයගේ උරුමක්කාරයන්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩුකරගන්නා |

| | | |
|---|---|---|
| | | ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගෙන් වහාම ඉල්ලා සිටිය වුවත්, ඒ පරිදී කටයුතු කර නොතිබුණි. |
| (ii) XII පරිච්ඡේදයේ 1.9 වගන්තිය | | 2014 මාර්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 128 දෙනෙකුගේ නිවාඩු අයදුම්පත්‍ර 1417ක් නිවාඩු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 137 හා 237(ආ) | 362,320 | සමාලෝචිත වර්ෂයේ සඟරාවක පිටපත් 10,000 ක් මුද්‍රණය කිරීම සඳහා 2013 දෙසැම්බර් 31 දින සැපයුම්කාර පුද්ගලික ආයතනයක් වෙත සම්පූර්ණ බිල්පත ගෙවා තිබුණි. අදාල මුද්‍රණ සඟරා 2014 අප්‍රේල් 09 දින දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු බැවින් ගෙවීම් කිරීමේදි අනුමැතිය හා සහතික කිරිම අදාල සැපයුම නිවැරදි භාර නොගෙන සිදු කර තිබුණු බව නිරික්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | | පුස්තකාල පොත් පසුගිය දශකය තුළ සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛය | | යන්ත්‍රය අලුත්වැඩියා කිරීමේ සම්පූර්ණ වගකීම 2013 සැප්තැම්බර් 30 දින තෙක් අදාල පුද්ගලික සමාගමට පැවරී තිබූ නමුත්, මාස 07 කට අධික කාලයත් අක්‍රියව තිබූ ඇඟිලි සලකුණු යන්ත්‍රය අලුත්වැඩියා කර ගැනීමට හෝ අදාල ආයතනය සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව නීතිමය කටයුතු කිරීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | 460,321 | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ස්ථාන මාරු වී ගොස් මාස තුනක් |

ඉක්ම වූ පසු අත්තිකාරම් ගිණුමේ නොපෙන්වීමට වගබලා ගතයුතු වුවත්, ස්ථාන මාරු වී ගොස් මාස 03 ඉක්මවූ නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ ගිණුමේ දක්වා තිබුණි.

**2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා**

-----------------------------------------

රැකියා පියස කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

2011 මැයි 12 දිනැති අංක අමප/11/0882/556/006 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව, රැකියා පියස ප්‍රතිව්‍යුහගත කිරීමේදී මූල්‍යමය බැදීම් නිරවුල් කිරීම සඳහා රු.මිලියන 10 ක අතිරේක ප්‍රතිපාදන 2011 වර්ෂයේදී ලබාදීමටත් අනෙකුත් අවශ්‍ය ප්‍රතිපාදන සඳහා 2012 වර්ෂයේ සිට මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමටත් අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාල වගකීම් පියවීමේදි රු.9,391,134 ක ගෙවීම් සඳහා ඉන්වොයිස්, බිල්පත් සහ අනුශාංගික සාක්ෂි නොමැතිව අදාල ගෙවීම් සිදුකර තිබූ අතර එම ගෙවීම් කිරීමේදි මුදල් රෙගුලාසි 137,138 හා 139 ප්‍රකාරව ගෙවීම් සිදුකරනු ලබන නිලධාරින් විසින් සළකා බැලිය යුතු කරුණු කිසිවක් සළකා බලා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ මූල්‍යමය බැදීම් නිදහස් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළද, ඇපයෙන් සීමිත සමාගමක් වූ රැකියා පියසෙහි ශේෂපත්‍රයේ සඳහන් පරිදී රු.18,248,231 ක ස්ථාවර වත්කම් පවරාගත් වහාම මෙම භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භාණ්ඩ පිළිබද සමීක්ෂණයක් කර මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව ලේඛනගත කිරීමටත්, වටිනාකම් හඳුනාගැනීමටත්, භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමටත්, කටයුතු කළ යුතු වූවද, 2014 ඔක්තොබර් 01 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) රැකියා පියස කාර්යාලය, දෙපාර්තමේන්තුව විසින් පවරා ගන්නා විට පරිගණක ඇතුලු "Server" එක ක්‍රියාත්මක තත්ත්වයේ පැවතියත්, පවරා ගැනීමෙන් පසුව එය ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.7 කාර්යසාධනය

------------------

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

------------------------------------------------------

දෙපාර්තමේන්තුව ඉලක්ක කරගත් ව්‍යාපෘති හා වැඩසටහන් 55 කින් 25කට හෙවත් සියයට 45කට අදාල ඉලක්කයන්ට ලගාවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපෘති වෙනුවෙන් වර්ෂය තුළ සළසා තිබුණු රු.මිලියන 24ක ප්‍රතිපාදනවලින් දෙපාර්තමේන්තුව රු.මිලයන 17.9 ක් පමණක් වැය කර තිබුණු අතර රු.මිලියන 6.1 ක් හෙවත් සියයට 25ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

----------------------------------------

**ගැලපුම් කළයුතු ශේෂ**

--------------------------

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 06 ඉක්මවූ, නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.221,335ක් වටිනා චෙක්පත් 07ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 317කට දෙපාර්තමේන්තුවට අයත් මානව සම්පත් නිලධාරින් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් වෙනුවෙන් රු.765,268ක් වැය කර අත්පොත් වර්ග 08ක් මුද්‍රණය කර තිබුණි.

(ආ) අවශ්‍යා අත්පොත් සැලැසුම් කිරීම, මුද්‍රණය, බෙදාහැරීම් කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවැති අතර, අත්පොත් වල දත්ත හා තොරතුරු වර්ෂ 05කට වඩා පැරණි ඒවා විය.

## 2.10 පාඩු හා හානි

----------------

2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආයතනයේ සේවකයින් හා නිලධාරීන් 37දෙනෙකු විසින් රු.41,945ක් වටිනා පොත් 129ක් පුස්තකාලයෙන් බැහැර ගෙන ගොස් තිබුණු අතර ඒවා ආපසු භාර දී නොතිබුණි. මෙයින් පොත් 14ක පිරිවැය විගණනයට අනාවරණය නොවුණි.

**2.11 අනාර්ථික ගනුදෙනු**

-----------------------

2013 දෙසැම්බර් 31 දින වන විටත් අක්‍රියව පැවති පුස්තකාලයේ පොත් තොගය ගබඩා කර ඇති කාමරය සඳහා මාස 20ක කුලිය ලෙස රු.551,212 ක් වැයකර තිබූ අතර, එය අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

**2.12 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

2012 දෙසැම්බර් 31 දිනට ඡායා පිටපත් කඩදාසි පැකට් 91ක් ගබඩාවේ පැවතියදී වර්ෂය තුළ පැකට් 900 ක් රු.463,380 ක් වැයකර මිලදීගෙන තිබුණි. පසුගිය වර්ෂයේ ඉතිරි පැකට් 91 න් විගණන දිනය වූ 2014 ඔක්තෝබර් 01 දින දක්වා පැකට් 11 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව රු.41,190 ක් පමණ වටිනා කඩදාසි පැකට් 80 ක් යල් පැනීමේ අවධානමකට ලක්වී තිබුණි.

**2.13 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 09 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 673 | 543 | 130 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 10 | 04 |
| | **එකතුව** | **702** | **562** | **140** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 140 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව පුස්තකාලයක් ස්ථාපිත කර තිබුණද පුස්තකාලාධිපති තනතුරක් අනුමත කරගෙන නොතිබුණි.